# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2002-04-08 වන දින පෙර වරු 11.00 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්

| | | |
|---|---|---|
| 3. එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 2. ආචාර්ය ගාමිණී ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 3. එස් මුදුරප්පෙරුම | මහතා | අධ්‍යක්ෂ |
| 4. එස් සංගරපිල්ලේ | මහතා | ආරාධිත |
| 5. ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 6. මිගාර ප්‍රනාන්දු | මහතා | වැඩසටහන් සම්පාදක පද්ධති විශ්ලේශක |
| 7. ජේ දොඩම්ගොඩ | මහතා | ජේ. සංඛ්‍යාලේඛනඥ |
| 8. ඩී ඩී එම් වී පෙරේරා | මෙය | ජේ. සංඛ්‍යාලේඛනඥ |
| 9. සී ඩී ද සිල්වා | මහත්මිය | ජේ. සංඛ්‍යාලේඛ නඥ |

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී කරුණු කිහිපයක්ම සාකච්ඡාවට භාජනය කොට පහත තීරණයන්ට එළඹිණ.

කෘෂිකර්ම සංගණනයේ දත්ත සැකසුම් කටයුතු පිළිබඳව ප්‍රථමයෙන් සාකච්ඡාවට භාජනය වි ය. දත්ත සැකසුම් අංශය සමග සැළසුම් කෙරෙන වැඩසටහනක් ලබා දී කෘ සං 1 උපලේඛනයෙන් ලබා ගන්නා මූලික වැදගත් තොරතුරු සියල්ලම සාරාංශ වාර්තාවේ (කෘ සං 3) ග්‍රාම නිලධාරි කොට්ඨාස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ දිස්ත්‍රික් මට්ටමෙන් සංඛ්‍යාලේඛන වගු ලබා දීමට හැකි වනසේ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ පරිගනකයෙන්ම කඩිනමින් විශ්ලේශනය කර ගැනීමට අදාල වගුවල ආදර්ශ කිහිපයක් සාකච්ජාවට භාජනය කෙරිණ. මෙම වගු සමග ජන සංගණනයේ ලබාගත් ජනගහන තොරතුරුද එකාබද්ධ කොට ලබාගැනීමට ද සැළසුම් කොට ඇත. ඒ සඳහා ජන සංගණන අංශයේ කේතාංකම යොදා ගැනීම අවශ්‍ය බව පෙන්වා දෙන ලද අතර 14 වන අංශයෙන් සකස් කරන ලද කේතාංක දැක්වෙන මුද්‍රිත ලැයිස්තු ප්‍රයෝජනයට ගන්නා ලෙස් දන්වන ලදි.
දත්ත සැකසුම් අංශයේ වැඩසටහන් සම්පාදක පද්ධති විශ්ලේශක මිගාර ප්‍රනාන්දු මහතාද සහභාගි වූන අතර එම කටයුතු සම්බන්ධිකරනය කිරීමට කෘෂිකර්ම අංශයේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ ජේ . දොඩම්ගොඩ මහතාට පැවරිණ. මේ සඳහා එම අංශවල නිලධාරීන් පුහුණු කොට දැණුවත් කිරීම වැදගත් බවද පෙන්වා දෙන ලදි. භෝග වර්ග 60කත් ග්‍ර නි කොට්ඨාස ඇතැම් විට 150 ක් දක්වාත් දීර්ඝ වගු ලබා ගැනීමට හැකිවන අයුරින් දත්ත වැඩ සටහන් සැකැසිය යුතු බවද පැවසින.

කෘ සං 2 හි තොරතුරු වල සාරාංශ ඇතුලත්ව කඩිනමින් ලබා ගැනෙන කෘ සං 4 නම් සරාංශ වාර්තාව මඟින් ලබා ගැණිමට අපේක්ෂිත තොරතුරුද ඇතුලත් සංඛ්‍යාන වගුවල ආදර්ශ වගු ඉදිරි රැස්වීම්වලට ඉදිරිපත් කිරීමට නියමිතය.

අනතුරුව සාකච්ජා කෙරුණේ සංඛ්‍යාලේඛන නිලධාරීන්ගේ වගකීම් හා කාර්යභාරය පිළිබඳව සැකසූ කලින් දින සාකච්ජා කල කෙටුම්පත පිළිබඳවයි. මෙම කෙටුම්පතට නිලධාරීන් පුහුණු කිරීම ,ලේඛන බෙදා හැරීම හා ආපසු භාර ගැණිම, අධීක්ෂණ කටයුතු , සම්බන්ධීකරණය ආදිය පිළිබඳ සවිස්තර උපදෙස් අඩංගු කොට තිබිණ.

F1 ලේඛනය ගැන වඩාත් සැළකිළිමත් විය යුතු බව අධ්‍යක්ෂ ජනරාල් ගේ අදහස වූ අතර ඒ සඳහා ආකෘති බාර දීමේ දී සහ ආපසු ලබා ගැණිමේ දී F1 ලේඛනයත් අදාල සංගණන කාණ්ඩ අංකය ද

සඳහන් කොට බාර දීමට හැකිවන අයුරින් මුද්‍රිත ආකෘතියක් සකස් කොට ඇති බව ප්‍රකාශ විය. කෙසේ වුවද F1 ලේඛනයන් පිළිබඳ පූර්ණ වගකීම දිස්ත්‍රික් ජ්‍යෙ සං ලේ හා සං ලේ වරු වෙත පැවරෙන බව සඳහන් කරන ලෙස දන්වන ලදි.

ප්‍රචාරය ලබා දීම

සංගණනය පිළිබඳව ගොවි ජනතාව අතර පුළුල් ප්‍රචාරයක් දීමත් එමගින් දත්ත ලබා ගැනීමේ කටයුතු සඳහා ඔවුන්ගේ සහයෝගය දිනාගැනීම සහ ඒ තුළින් එම දත්ත වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ ත් අරමුණ ඇතිව පහත සඳහන් පියවරවල් ගැනීම සළකා බැලිණ.

පාසල් විදුහල්පති වෙත යැවෙන ලිපියක් මගින් ළමුන් හරහා සිය මව්පියන් වෙත ගෙන යන පණිවුඩයක් මුද්‍රණය සඳහා අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවෙන් නිපදවන පාසල් අභ්‍යාස පොත් වල පිටකවරයේ අනුග්‍රාහක පදනම යටතේ කෘෂිකර්ම සංගණනය - 2002 අගෝස්තු යන පාඨය මුද්‍රණය කරවා කෘෂි ක්ෂේත්‍රයට අදාල සිත්ගතිනා ජයාරූපයක් මුද්‍රණය කිරීම සිත්ගන්නා ජායා රූපයක් ඇතුළත් කිරීමටත් කැමත්ත පළ කොට ඇත.

කලින් වතාවේ මෙන් වෘත්තීය චිත්‍ර ශිල්පියකුගේ චිත්‍රයක් ඇතුළත් කොට 15 20 ප්‍රමාණයේ දැන්වීමක් රතු පසු බිමේ කළු සුදු වර්ණ යොදා සිංහළ සහ දෙමළ භාෂා වලින් මුද්‍රණය කර ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති ගෙන් මිළ ගණන් කැඳවීමට තීරණය විය.

අනතුරුව සාකච්ඡා කෙරුණේ ගෙවීම් පිළිබඳවයි.

රැස්වීමේ කටයුතු දහවල් 12.30 ට පමණ අවසන් වූ අතර මීලග රැස්වීම 18-04-2002 දිනට පැවත්වීමට තීරණය විය.

ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ
(ජේ දොඩම්ගොඩ)